www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාවෙහි වැන්දඹු ස්ත්‍රීන්ගේ ශෝචනීයත්වය

**The plight of widows in India**

***වෝටර්, රචනය සහ අධ්‍යක්ෂණය දීපා මේතා***

**පානිනි විජේසිරිවර්ධන සහ පාර්විනි සෝරා විසිනි**
**2006 මැයි 15**

දීපා මේතාගේ මෑත ම වෘත්තාන්තය වූ ද ඇයගේ " මූලද්‍රව්‍යාංග ත්‍රිත්වයෙහි" අවසානතමය වූ ද *වෝටර්* චිත්‍රපටය පසු ගිය මාස කීපය පුරා නොයෙක් ජාත්‍යන්තර චිත්‍රපට උලෙලවල දී ප්‍රදර්ශනය කර තිබේ. මේ වන විට එය කැනඩාව, ඕස්ට්‍රේලියාව හා එක්සත් ජනපදය තුල තිරගත වන අතර අනෙකුත් රටවල ද ඉදිරියේ දී තිරගත කෙරෙනු ඇත. තුන් ඈඳුතු චිත්‍රපටයේ පලමු කෘති දෙක මෙන් ම -- *ෆයර්* (1996) සහ *අර්ත්* (1999) -- මෙම චිත්‍රපටය ද බොහෝ ප්‍රශංසා හා විචාරක ගෞරවය අත් කර ගෙන ඇත.

ඉන්දියාව පදනම් කර ගනිමින් හින්දි බසින් තැනූ මේතාගේ තුන් ඈඳුතු චිත්‍රපටය ආගමික අසහනයේ හා සංස්කෘතික පසුගාමිත්වයේ විවිධ රූපාකාරයන්ට අභියෝග කරයි -- එනම් ලිංගික ආධානග්‍රාහිත්වය *ෆයර්*, ආගමික නිකායවාදය *අර්ත්* හා වැන්දඹු ස්ත්‍රීන් මුහුන දෙන පීඩනය *වෝටර්* යි. මේ හේතුව නිසා, හින්දු මූලධර්මවාදී භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) ද හින්දුත්වා (හින්දු ජාතිකවාදී) දෘෂ්ටිවාදය යටතේ පැරනි සමාජ වටිනාකම් හා ආගමික භාවිතයන් යලි පන ගැන්වීමකට කැඳවුම් කරන ඊට අනුබද්ධ අන්තවාදී සංවිධානවල ද දුෂ්ට දේශපාලනික ප්‍රහාරවල ඉලක්කයක් බවට මේතා පත්ව ඇත.

1996 දී *ෆයර්* චිත්‍රපටය නිකුත් වීමත් සමග හින්දු අන්තවාදීහු කැරලි ගැසීම් හා සිනමා හල් ගිනි තැබීම් සිදු කලහ, 1998 දී *අර්ත්* චිත්‍රපටය තහනම් කිරීමට ප්‍රයත්න දැරූහ, එමෙන් ම 2000 වසර මුල දී *වෝටර්* චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු අත හැරීමට මේතාට බල කලහ. ඒ සමයේ දී, බීජේපීයේ අනුබද්ධ සංවිධානයක් වන ආර්එස්එස් (රාෂ්ට්‍රීය ස්වයම්සේවක් සංග්) විසින් උසි ගන්වන ලද 2,000ක පමන කලහකාරී පිරිසක් ඉන්දියානු උත්තර් ප්‍රදේශ් ප්‍රාන්ත රාජ්‍යයේ වාරනසීහි ගොඩ නගා තිබූ මේතාගේ චිත්‍රපට දර්ශන තල විනාශ කලහ.

හින්දු දහමට එරෙහි ක්‍රිස්තියානි කුමන්ත්‍රනයක කොටසක් ලෙස ඉන්දියානු ස්ත්‍රීන් ගනිකාවන් හැටියට චිත්‍රනය කිරීම මෙන් ම ඉන්දියාව තුල බටහිර මර්දනකාරිත්වයට පවා සහාය පල කිරීම පිලිබඳව චිත්‍රපටයට ව්‍යාජ ලෙස චෝදනා කෙරුනි, මේතාට හා ප්‍රධාන නිලියන් වූ ශබානා ආස්මි හා නන්දිතා දාස්ට එරෙහිව ඉහල නැංවුනු විරෝධතාවන්, ප්‍රචන්ඩත්වය සහ පෞද්ගලික මරන තර්ජන මධ්‍යයේ අධ්‍යක්ෂවරිය නිෂ්පාදන කටයුතු අවලංගු කිරීමට තීරනය කලා ය.

චිත්‍රපටය නිපදවීමට මේතාට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට සහාය පල කරමින්, අධ්‍යක්ෂවරියත් සියලු ආගමික හෝ ආන්ඩු පාලනයෙන් නිදහස්ව තම නිර්මාන කටයුතු කර ගෙන යාමට ඇයට ඇති අයිතියත් ආරක්ෂා කරනු වස් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සැනෙකින් ජාත්‍යන්තර උද්ඝෝෂනයක් දියත් කලේ ය. (බලන්නː "*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ආයාචනයක් නිකුත් කරයිː ඉන්දියානු චිත්‍රපට නිර්මාතෘ දීපා මේතාට එරෙහි හින්දු අන්තවාදී ප්‍රහාරවලට විරුද්ධ වනු" ). උද්ඝෝෂනය ජාත්‍යන්තරව චිත්‍රපට නිර්මානකරුවන්, කලාකරුවන් හා ලේඛකයන් පෙලක සහාය ලද්දේ වුව ද ඉන්දියානු වානිජ චිත්‍රපට කර්මාන්තයේ, විශේෂයෙන් බොලිවුඩයේ නිවහන වන මුම්බායිහි මුඛ්‍ය පුද්ගලයෝ ප්‍රකාශනයේ නිදහසට එල්ල වූ මෙම අලජ්ජී ප්‍රහාරයේ දී නිහඬව සිටිති.

2000 දී *වෝටර්* චිත්‍රපටයේ වැඩ කටයුතු අවලංගු කිරීමට මේතාට බල කෙරුන ද කිසි දා සිය ව්‍යාපෘතිය අත් නොහල ඇයට, ආරුඪ කල නමක් හා නව නලුනිලි කැලක් සමගින් සහ දැඩි රහස්‍ය භාවයක් යටතේ ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදන කටයුතු යලි ඇරඹීමට අවසානයේ පසු ගිය වසරේ දී හැකියාව ලැබුනි. *ෆයර්* හා *අර්ත්* චිත්‍රපටවල ප්‍රධාන නිලිය නන්දිතා දාස් වෙනුවට වූ වඩා තුරුනු ලීසා රේ යොදා ගැනුනු අතර සීමා බිස්වාස් (බැන්ඩිට් ක්වීන්) කලින් ශබානා ආස්මිහට පවරා තිබූ ශකුන්තලාගේ චරිතය රඟපෑවා ය.

*වෝටර්* චිත්‍රපටය පදනම් කෙරෙනුයේ 1938 බ්‍රිතාන්‍ය-පාලිත ඉන්දියාවෙහි, මහත්මා ගාන්ධි හා විජිත-විරෝධී ව්‍යාපාරය පැන නැගීමේ පසුබිම අබිමුව ය. එවන විටත් ඉන්දියාව තුල පුලුල්ව භාවිතයේ පැවති ලමා විවාහ ක්‍රමයේ ගොදුරක් වූ අට වියැති චුයියා (සරලා) 50 වියැති තම ස්වාමිපුරුෂයා මිය ගොස් ඇති බව දැන ගැනීමත් සමග කතන්දරය ඇරඹෙයි.

හින්දු සිරිත්විරිත්වලට අනුව වැන්දඹු ස්ත්‍රීන්ට විකල්ප තුනක් තිබුනිඃ එනම් තම ස්වාමිපුරුෂයන්ගේ බාල සොහොයුරා විවාහ කර ගැනීම; තම මිය ගිය ස්වාමිපුරුෂයාගේ චිතකයට පැන දිවි නසා ගැනීම; හෝ ආත්ම පරිත්‍යාගී ජීවිතයක් පටන් ගැනීම යි.

තමන් දැන් මුහුන දෙන තත්ත්වය කෙසේ වෙතත් විවාහප්‍රාප්ත වීම පවා යාන්තමින් මතකයෙහි රැඳුනු තුරුනු දැරිය ඇගේ පියා ගංගා නම් ගංගා නිම්නයෙහි පිහිටි වාරනසී නම් හින්දු ශුද්ධ නගරයෙහි ආශ්‍රමයකට නොහොත් වැන්දඹු නිවාසයකට ඇය පිටත් කොට යවයි. මුඩු කල හිසකින් යුතු ඇගෙන් අපේක්ෂා කෙරෙනුයේ දේපලකින් හෝ පෞද්ගලික ආදායමකින් තොර වූත් අවශේෂ සමාජයෙන් වෙන් කෙරුනා වූත් දරිද්‍රතාවෙන් මැඩී ගිය නිවාසයෙහි ජීවිතයේ ඉතිරි කාලය ගෙවා දැමීම යි.

දුකින් සිත කැලඹී සිහි විකලව ගිය චුයියා අවසානයේ අනෙක් වැන්දඹු ස්ත්‍රීන් 14 දෙනා ද සමග අබලන් ගොඩනැගිල්ල තුල ගෙවන ආශ්‍රම ජීවිතයට හුරු වෙයි. නිතර රොස් පරොස් බෙනෙන දූෂිත මහලු වැන්දඹු ස්ත්‍රියක වන මධුමතී (ප්‍රවීන ඉන්දියානු නිලියක වන මනෝරාමා විසින් රඟ දැක්වෙයි) ආශ්‍රමය පාලනය කරයි. ඇය හැම රැයක ම වේශ්‍යා ස්ත්‍රීන් සපයන ප්‍රාදේශීය තැරැව්කරුවෙකු මෙන් ම නපුංසකයෙකු ද වන ගුලාබ් (රගුවීර් යාදව්) විසින් සැපයෙන මරිජුවානා දුම් උරමින් සිටින්නී ය.

ගඟෙන් එගොඩ ගොඩේ සිටින ප්‍රාදේශීය බ්‍රාහ්මනයන් හා උසස් කුලවල මහතුන් උදෙසා රූමත් යොවුන් වැන්දඹු ස්ත්‍රියක වන කල්‍යානි (ලීසා රේ) ගනිකා වෘත්තියෙහි යෙදවීමෙන් මධුමතී හා ගුලාබ් අමතර ආදායමක් උපයන අතර ආශ්‍රමය නො නැසී පවත්වා ගෙන යාම වෙනුවෙන් ඉන් කොටසක් යෙදීමට පුරුදුව සිටී. සිය ගනුදෙනුකරුවන්ට වඩාත් ආකර්ෂනීය වනු පිනිස හිස මුඩු නොකල කල්‍යානි නිවාසයෙහි වෙන ම කොටසක දිවි ගෙවන්නී ය. ඇය සතුව කුඩා බලු කුක්කෙක් ද සිටී.

ආශ්‍රමයෙහි සිටින අනෙක් මුඛ්‍ය පුද්ගලයන් වන්නේ බැතිමත් හින්දු ආගමික කාන්තාවක හා වැන්දඹු ස්ත්‍රීන් අතර සිටින වඩාත් ම කාරුනික මෙන් ම ගුඪ බවින් යුක්ත වූ මැදි වියේ පසු වන ශකුන්තලා, සහ චුයියාගේ එක ම සැනසීම බවට පත් වන "ආන්ටී" (විදුලා ජවාල්ගකාර්) නමින් හැඳින්වෙන වැඩිහිටි ස්ත්‍රියකි. සිය ආගමික භක්තිය හා සිය මානුෂ ආශාවන් අතර සිර වන ශකුන්තලා චුයියාගේ දෙවන මවක බවට පත් වෙයි.

කඩවසම් තරුන නීති උපාධිධරයෙකු වන නාරායන් (ජෝන් ඒබ්‍රහම්) ගඟෙහි දිය නාන අතරතුරක කල්‍යානිගේ බලු කුක්කා පැන යාමෙන් අනතුරුව ඌ වට කොට අල්ලා ගැනීමට චුයියාට උපකාර කල කල්හි ඔහු හා කල්‍යානි අතර ප්‍රේම වෘත්තාන්තය පන ගැන්වෙයි. කෙසේ වුව ද, ඔවුන්ගේ පෙම් සබඳතාව ආශ්‍රමයෙහි සාමාන්‍ය ගතිකයට තර්ජනය කරයි.

නාරායන් කුල පීඩනයේ විරුද්ධවාදියෙකු වන අතර බ්‍රිතාන්‍ය විජිතවාදී පාලනයට එරෙහි මහත්මා ගාන්ධිගේ "සත්‍යග්‍රහ" ව්‍යාපාරයේ සහායකයෙකි. අතිශයින් ම පෙමින් වෙලුනු ඔහු වැන්දඹු ස්ත්‍රීන් කෙරෙහි පැතිර පවත්නා පීඩනය ප්‍රතික්ෂේප කරන අතර, වැන්දඹු ස්ත්‍රීන්ට යලි විවාහ වීමට හැකියාව ලබා දෙමින් අලුතින් හඳුන්වා දුන් නෛතික ආඥාවක් පදනම් කර ගෙන තමන් සමග ආවාහ වන ලෙස කල්‍යානිගෙන් ඉල්ලා සිටියි.

සැලසුම් කොට ඇති විවාහ මංගල්‍යය ගැන චුයියා කිසිදු බරක්පතලක් නොමැතිව මධුමතීට කී විට මහලු ස්ත්‍රිය කුපිත වී එය වලකා ලීමට තර්ජනය කරයි. ඇ කල්‍යානිගේ හිස මුඩු කොට ඇය ආශ්‍රමය තුල සිර කරයි. කෙසේ නමුත් මධුමතී නො සලකා ක්‍රියා කිරීමට තීරනය කරන ශකුන්තලා තරුන ස්ත්‍රිය නිදහස් කරයි.

චිත්‍රපටයේ සියලු විස්තර හෙලිදරව් නො කොට කිව හොත්, නාරායන්ගේ පියා තමන්ගේ ගනුදෙනුකරුවෙකු බව කල්‍යානි දැන ගන්නා අතර චිත්‍රපටය ඛේදජනක හැරීමක් අත් කර ගනී. මහත් සේ දොම්නසට පත් වන ශකුන්තලා චුයියා මුදා ගෙන පැන යද්දී මහත්මා ගාන්ධිට -- ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ නායකයා ජාතික පරිමානව සිදු කල දුම්රිය සංචාරයක් අතරතුර දී -- සවන් දෙන ජන සන්නිපාතයක් තුලට ඇය තල්ලු වී ඇදී යයි.

සත්‍යය සොයා යාම කෙනෙකුගේ ආගම විය යුතු ය යන ගාන්ධිගේ කෙටි අදහසින් පෙලඹුනු දොම්නසට පත් ශකුන්තලා, "ලමා වැන්දඹුව ගාන්ධිට භාර දීම" මගින් ඇය ආරක්ෂා කර ගැනීමට තමන්ට උපකාර කරන්නැයි නොයෙක් ජනයාගෙන් අයදියි. ගාන්ධිගේ සංචාරයට එක් වීමට නාරායන් තීරනය කොට ඇතැයි ශකුන්තලා දැන ගැනීමත් සමග චිත්‍රපටය නිමා වෙයි. නැවතුම් පොලෙන් දුම්රිය පිටත්ව යද්දී ඔහු සිය දෑතින් දරුවා ඔසවා ගනී.

සීමා බිස්වාස්ගේ හා සරලාගේ බලගතු රංග කාර්යයන් සමග වූ අතිශය සංචලනාත්මක දර්ශන ගනනාවක් ද

ගයිල්ස් නට්ගන්ගේ කැමරාකරනයේ හා ඒ.ආර්. රහ්මාන්ගේ සංගීතයේ සමහර සිත් කා වදින අවස්ථා ද *වෝටර්* චිත්‍රපටය සතු වේ. සංකේතාත්මක වන එහි නාමය චිත්‍රපටයේ විෂයට - ජලය මානව වර්ගයා වෙත මැවුම්කරුවාගෙන් ලැබුනු අත්‍යුත්තම ත්‍යාගය ලෙස සලකන හින්දු ධර්මය - අතිශයින් ම සුදුසු නාමය විය හැකි ය. චිත්‍රපටයේ කේන්ද්‍රීය ප්‍රේම වෘත්තාන්තයට හා එහි ඛේදජනක අවසානයට පසුතලය සකසමින් වර්ෂාව හා නදිය සමග ජලයේ ප්‍රතිරූප සැම තැන යලි යලිත් ඉදිරිපත් වෙයි.

චිත්‍රපටයේ වඩාත් ම අනුකම්පා සහගත හා මුලුමනින් ම තීව්‍රත්වයට පත් කෙරෙන දර්ශන පෙලක් වන්නේ මහලු වැන්දඹු ස්ත්‍රිය වන ආන්ටිට දීම සඳහා ලඩ්ඩුවක් (බදින ලද රස කැවිල්ලකි) සොරෙන් ගෙන ඒමට චුයියා සමත් වූ අවස්ථාවේ වැන්දඹු ස්ත්‍රීන් පෙලන අත්‍යන්ත වියෝග දුක්ඛය යි. මෙය වැන්දඹු ස්ත්‍රීන්ට තහනම් කෙරී ඇති බොහෝ ආහාර වර්ග අතරින් එකක් වේ. ආන්ටී ද වරෙක ලමා මනමාලියකව සිටියේ ප්‍රීතියෙන් පිනා ගොස්, තමන් මෙම විශේෂ රස කැවිල්ල අවසන් වරට කට ගැවේ තමා විවාහ වූ දා බව සිහිපත් කරමින් මහත් කැදරකමින් ලඩ්ඩු කා දමයි.

නිසැකව ම *වෝටර්* චිත්‍රපටයේ අතිශය මූලික චරිතය වනුයේ චිත්‍රපටයේ අවසානය කරා යොමු වෙද්දී වඩාත් මතු වී පෙනෙන භූමිකාව වන ශකුන්තලා යි. තමන් මුහුන පා සිටින පීඩාකාරී තත්ත්වයන්ට වගකිව යුතු ආගමික වටිනාකම් තුල ම සැනසීම සොයන පුද්ගලයන් මුහුන දෙන සාමාජීය හා මනෝවිද්‍යාත්මක ප්‍රතිවිරෝධතාවන් තීව්‍ර ගෙන හැර දැක්වීමට මේතා ශකුන්තලා යොදා ගනියි. තම නිසග කරුනාවන්තකම ද තමන් තුල වන මනුෂ්‍යත්වය මැඩ ලන්නැයි තමන්ගෙන් ඉල්ලා සිටින සම්ප්‍රදායයන් ද අතර අගාධය පියවීමට ශකුන්තලා දරන ප්‍රයත්නයන් සියුම්ව චිත්‍රනය කිරීමේ දී සීමා බිස්වාස්ගේ රංග කාර්යය අත්‍යසාමාන්‍ය වේ.

පැතිර පවත්නා ආගමික තහංචිවලට එරෙහිව ඇය කල්‍යානි හා නාරායන්ගේ ආදර අන්දරයට උදව් කරයි. ඇත්ත වශයෙන් ම ආශ්‍රමය තුල සිටින එක ම උගත් වැන්දඹු ස්ත්‍රිය වන ඇය නාරායන් කල්‍යානිහට ලියන පෙම් හසුන් කියවන අතර පෙම් යුවලට රහසේ පැන යාමට පවා උදව්උපකාර පිරිනමන්නී තමා වඩා වාසනාවන්ත වූත් තමන්ගෙන් වියෝ කෙරුනා වූත් ජීවිතයක් සුසාධ්‍ය කරන බව ඒත්තු ගනී.

*වෝටර්* චිත්‍රපටය වැන්දඹු ස්ත්‍රීන්ගේ අයිතීන් පැහැර ගැනීම පසුපසින් පවත්නා ඇතැම් ආර්ථික සාධක බලගතු ලෙස සලකුනු කරයි. නාරායන් පහදා දෙන පරිදි වැන්දඹු ස්ත්‍රීන් ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ගෙන්, පවුලෙන් හා දේපලවලින් වෙන් කෙරුනු කල්හි ඔවුන්ටඃ "කන්න තියෙන කටක් අඩු වෙනවා. සාරි හතරක වියදම ඉතුරු වෙනවා. පවුලේ නිවහනේ ඇඳක් හා මුල්ලක් ඉතුරු වෙනවා. ඔබ මෙහෙ එච්චේ ඇයි ද කියන එකට වෙන හේතුවක් ඇත්තේ නැහැ." වැන්දඹු ස්ත්‍රීන්ට සැලකීම ආගම ලෙස වෙස් ගැන්වුනු විට ඔහු නිගමනය කරන්නේ, "මේ ඔක්කොම සල්ලි නිසා" බව යි. මෙම වැකි කිහිපය අතිශය බලගතු ආකාරයකින් පවත්නා තත්ත්වය එලිදරව් කරයි.

මේතාගේ චිත්‍රපටය මෙම කුරිරු හා අමානුෂික " සම්ප්‍රදායයන්" උදෙසා ගෙවිය යුතු මානව පිරිවැය ප්‍රබල අයුරින් නාටකීකරනය කරතත් චිත්‍රපටයේ අභියෝගාත්මක විෂය කරුනට විකාර සහගත දෑ එක් කරන්නා වූත් එහි නාට්‍යමය සංඝට්ටනයේ තියුනු බව මොට කරන්නා වූත් බොලිවුඩ් සම්මුතිවාදයේ හා අතිනාට්‍යයේ මුඛ්‍යාංග ද එය දරා සිටියි. නාරායන් හා කල්‍යානි අතර පෙම් සබඳතාව නිසැකව ම ආවශ්‍යක ආඛ්‍යානමය සංරචකයක් වන නමුදු පෙම් යුවලට මීට වඩා ගැඹුරක් හා සංකීර්නතාවක් ගෙන දීම අවශ්‍ය වෙයි. ඔවුන්ගේ පෙම් සබඳතාව සතුව සියලු බාහිර දේ -- රුසිරෙන් යුක්ත ජනයා, ශෘංගාරාත්මක දෘශ්‍ය රූප හා උදානාත්මක සංගීතය, සහ කාලිදාසයන්ගේ " මේඝ දූත" ප්‍රේම කාව්‍යයෙන් උපුටා ගත් ගායනයක් පවා -- තිබෙන නමුදු එය නිර්ව්‍යාජ බලගතු බව පිලිබඳ ඌනතාවන්ගෙන් පෙලෙන්නේ ය.

තව දුරටත් කිව හොත්, හිටපු නිරූපිකාවක වන ලීසා රේ දරිද්‍රතාවෙහි ගිලී ගිය ආශ්‍රමයක සාමාජිකාවකට හා ගනිකාවකට වඩා බොහෝ සෙයින් ශෝභමාන හා සුලලිත වේ. සිනමා වීරයන් ගනනාවකට පසු බොලිවුඩය අතිශය අපේක්ෂා සහගතව සිටින නාරායන් ලෙස රඟන ජෝන් ඒබ්‍රහම් මටසිලුටු විලාසිතා සංග්‍රහයකින් මේ දැන් පිටතට ආවා දෝ හෝ යි ඇතැම් විට පෙනී යයි. ඔහු *වෝටර්* චිත්‍රපටයේ වඩාත් සවිඤ්ඤානක දේශපාලනික දේහකාය වන්නේ යැයි කල්පනා කෙරෙන නිසා ඔහුගේ චරිතය ලාලසී බවින් යුක්ත විය යුතු වුව ද එම ගුනයෙන් හීන වීම ගැටලුවක් වේ.

ගාන්ධි සම්බන්ධ කොට ගත් චිත්‍රපටයේ අවසන් දර්ශන ඔහු ලද මහා ජන සහාය පිලිබඳව ද ඔහු හා ඔහුගේ ඉන්දියානු ජාතික කොන්ග්‍රසය බ්‍රිතාන්‍ය පාලනය, කුල ක්‍රමය හා ආර්ථික හා සමාජ පරිපීඩනයේ අනෙකුත් රූපාකාරයන් අවසන් කරනු ඇතැයි දසලක්ෂ සංඛ්‍යාත මහජනකායන් තුල වූ බලාපොරොත්තු පිලිබඳව ද ඇඟවුමක් සපයයි.

ගාන්ධි හා කොන්ග්‍රසය ගැන තව දුරටත් කීවොත්, වැන්දඹු ස්ත්‍රීන් වෙන් කොට තැබීම හා "කුල හීනත්වය" වැනි කුල පීඩනයේ නිශ්චිත රූපාකාරයන් පිලිබඳ විවේචනයන් තිබිය දී ම, කුල ක්‍රමයට හෝ එහි ආවශ්‍යක දේශපාලනික හා ආර්ථික පදනම්වලට ඔවුහු කිසි දා අභියෝග නො කලහ.

ධනපති හා ඉඩම් හිමි දේපලවලට හා එය ආරක්ෂා කිරීමට ආධාරක වන චිරන්තන ආගමික දෘෂ්ටියට කම්කරු පන්තික අභියෝගයක් උසි ගැන්වේ ය යන භීතිය මගින් ගාන්ධි නායකත්වය දුන් කොන්ග්‍රසය මගින් මුල පුරන ලද අරගල හැම විට ම පදම් කෙරුනි. මෙය මහජනයා අභිමුඛ වන ආවශ්‍යක ගැටලු කිසිවක් විසඳිය නොහැකි බව සහතික කල අතර වැන්දඹු ස්ත්‍රීන්ගේ අයිතීන් පැහැර ගැනීම හා ඔවුන් වෙන් කොට තැබීම සහ සමාජ පරිපීඩනයේ අවශේෂ රූපාකාරයන් අද දක්වා ම ඉන්දියාව තුල පවතින බව තහවුරු කලේ ය.

ගාන්ධිවාදය යලි පන ගැන්වීම මගින් කෙසේ නමුත් මෙම ගැටලු විසඳිය හැකි යැයි බලාපොරොත්තු වන ඇතැම් විට මේතා ද ඇතුලු සමහරුන් සිටිනාතරේ ශකුන්තලාගේ වෙහෙසට පත් මුහුන සමගින් චිත්‍රපටය නිම වන අතර, 2001 දී ඉන්දියාව තුල දසලක්ෂ 34ක් වැන්දඹු ස්ත්‍රීන් සිටි බවත් ඔවුන්ගෙන් බොහෝ දෙනා තව මත් සාමාජීය, ආර්ථික හා සංස්කෘතික වියෝගයේ කොන්දේසි යටතේ ජීවත් වන බවත් පෙන්නුම් කෙරෙන නාමාවලියක් තුල අනතුරුව එය ක්‍රමයෙන් මැකී යයි. ගාන්ධිගේ ව්‍යාපාරය මෙය අවසන් කිරීමට අසමත් වූයේ ඇයි ද යන්නත් ඉන්දියානු මහජනතාවගේ අපේක්ෂාවන් මෙතරම් ම බේදාත්මක ආකාරයකින් සුන් කල හැකි වන්නේ කෙසේ ද යන්නත් දැන ගැනීමට කල්පනාකාරී ප්‍රේක්ෂකයන් කැමති වනු ඇත.

මේ මස පසු භාගයේ දී දර්ශන කප්පාදු කිරීමකින් තොරව *වෝටර්* චිත්‍රපටය මුදා හැරීමට ඉන්දියාවේ රැ ගුම් පාලක මන්ඩලය අනුමත කර ඇතත් චිත්‍රපටය හින්දු අන්තවාදීන්ගේ කෝපය නිසැකව ම උසි ගන්වනු ඇත. ඇගේ ධෛර්යය වෙනුවෙන් මේතාට ප්‍රශංසාව ශුභාසිංශන හිමි විය යුතු ය. තර්ජනය කොට භය ගැන්වීම නො තකා ඇය කල මෙම ප්‍රතික්ෂේප කිරීම ඉන්දියාවෙහි හා ඉන් ඔබ්බෙහි ආගමික පසුගාමිත්වයට හා අනෙකුත් සාමාජීය පීඩාවන්ට එරෙහිව සටන් වදින්නන් දිරිමත් කරනු ඇත. අඩුපාඩුකම් තිබිය දීත් *වෝටර්* චිත්‍රපටය වනාහි සැලකිය යුතු ජයග්‍රහනයක් වේ.

©
www.wsws.org